# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1879/33 - 2014 සැප්තැම්බර් මස 12 වැනි සිකුරාදා - 2014.09.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/15/42/2010

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2012.08.30 වැනි දිනැති හා අංක 1773/39 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2012.08.09 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් රජවැල්ල, නිලගම, දිගන, අංක 226 හි පදිංචි චන්ද්‍රා හේවගේ මිය හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 500 හි පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2014.08.18 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඩබ්. ජේ. එල් යූ. විජයවීර,
*වැ.බ.* - කම්කරු කොමසාරිස්.

2014 සැප්තැම්බර් මස 05 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කොළඹ කාර්මික අධිකරණයේ දී ය.

01. චන්ද්‍රා හේවගේ
අංක 226,
දිගන, නිලගම,
රජවැල්ල.

**ඉල්ලුම්කාරිය**

නඩු අංකය : ඒ/3472

**එදිරිව**

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
අංක 500,
ටී. බී. ජයා මාවත,
කොළඹ 10.

*වගඋත්තරකරු*

*අතර පවත්නා කාර්මික ආරාවුල සම්බන්ධවයි*

තීන්දුව හා ප්‍රදානය

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගරු ගාමිණී ලොකුගේ මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත ආඥා පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා එතුමාගේ IR/15/42/2010 සහ 2012.08.09 වැනි දිනැති දරන ලිපියෙන් බේරුම්කරු වශයෙන් මා පත් කර ඇත.

2. ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවත්නා කාර්මික ආරාවුලට හේතු වී ඇති කාරණය වශයෙන් ඉහත සඳහන් ආරාවුලට අදාළව මා වෙත එවා ඇති කම්කරු කොමසාරිස්ගේ අංක IR/15/42/2010 සහ 2012.08.03 දිනත් දරන ලිපියේ දක්වා ඇත්තේ,

1 A – G 20252 — 15 (2014/09)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

"ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සේවයේ නියුතු චන්ද්‍රා හේවගේ මහත්මියගේ 2000.11.27 දිනට නියමිත වැටුප් වර්ධකය වැඩිපුර ගෙවා ඇති බව පවසමින් විශේෂ හේතු දැක්වීමකින් තොරව මූලික වැටුප අඩු කර ගැනීම මගින් නැවත අයකර ගැනීම යුක්ති සහගතද යන්න හා එසේ නොවන්නේ නම් ඇයට හිමි විය යුතු සහන මොනවාද යන්න පිළිබඳ වේ" යනුවෙනි.

3. මේ අනුව ඉහත කී කාර්මික ආරවුල සම්බන්ධයෙන් අදාල ප්‍රකාශ ගොනු කිරීමෙන් පසුව දෙපාර්ශවය අතර සමථයක් ඇති කිරීමට බේරුම්කරණය උත්සාහ කලද එවැනි සමථයක් ඇති කළ නොහැකි වූයෙන් නඩු විභාගය ආරම්භ කරන ලදී.

4. මේ අනුව නඩු විභාගය 2013.06.24 වැනි දින ආරම්භ කල අතර ඉල්ලුම්කාරිය වෙනුවෙන් ඉල්ලුම්කාර චන්ද්‍රා හේවගේ යන අය පමණක් සාක්ෂි දුන් අතර නඩු විභාගයේදී ඇය වෙනුවෙන් ඒ 1 සිට ඒ 12 දක්වා ලේඛණ ලකුණු කරමින් තම නඩුව අවසන් කරන ලදී.

5. අනතුරුව වගඋත්තරකාර පාර්ශ්වය නඩුව ආරම්භ කරමින් පාලන සහකාර එස්. පී. රංජිත් යන අය පමණක් සාක්ෂියට කැඳවමින් නඩු විභාගයේදී ආර් 1 සිට ආර් 17 දක්වා වූ ලේඛණ ලකුණු කරමින් තම නඩුව අවසන් කරන ලදී.

6. ඉන් අනතුරුව දෙපාර්ශවය ලකුණු කල ලේඛණ සමග දෙපාර්ශවයේ ලිඛිත සැලකිරීම් ගොනු කරන ලෙසට බේරුම්කරණය විසින් දැනුම් දෙනු ලදුව ඒ අනුව එකී ලකුණු කල ලේඛණ සමග දෙපාර්ශවයේ ලිඛිත සැලකිරීම් ගොනු කර ඇත.

7. මේ අනුව මා විසින් දෙපාර්ශවයේ ප්‍රකාශත් වාචික සාක්ෂිත් ලකුණු කල ලේඛණත් සලකා බලමින් තීන්දු කල යුතුව ඇත්තේ මෙම ආරවුල සම්බන්ධයෙන් අදාළ යොමුවේ දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සේවයේ නියුතු චන්ද්‍ර හේවගේ මහත්මියගේ 2000.11.27 වැනි දිනට නියමිත වැටුප් වර්ධකය ගෙවා ඇති බව පවසමින් විශේෂ හේතු දැක්වීමකින් තොරව මූලික වැටුප අඩුකර ගැනීම මගින් නැවත අය කර ගැනීම යුක්ති සහගත ද යන්න හා එසේ නොවන්නේ නම් ඇයට හිමි විය යුතු සහන මොනවාද යන්න වේ.

8. මෙම නඩුවට අදාළව පළමු පාර්ශ්වය විසින් තම 2012.09.10 වැනි දිනැති පළමු ප්‍රකාශය මගින් දක්වා ඇත්තේ තමන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ලිපිකාරිණියක ලෙස 1985.02.06 දින සිට සේවය කරන අතර ලිපිකරු I ශ්‍රේණියට තරඟ විභාගයකින් හා සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව 1997.11.27 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පළමුවන ශ්‍රේණියට උසස් කල බවත් එකී ප්‍රකාශය සමග ඇමුණුම 1 වශයෙන් යා කර තිබූ උසස්වීම් ලිපියේ දැක්වෙන වැටුප් පරිමාණයට හා වැටුප් පියවරට අනුව 2009/07 මාසය සඳහා වැටුප් ලබාගත් බවත් දක්වා ඇත. එකී ඇමුණුම 1 අනුව 1997.11.27 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පළමුවන ශ්‍රේණියට උසස් කිරීමේදී වැටුප් පරිමාණය වශයෙන් රු. 6,150 = 2 x 130 - 13/205 = රු. 9,075 දක්වා ඇති අතර එකී වැටුප් පරිමාණයේ රු. 5,853/- ක මාසික වැටුප් මත පිහිටුවා 1997 වැටුප් ප්‍රතිශෝධනය අනුව 1998.01.01 වැනි දින සිට රු. 7,230/ ක මාසික වැටුපක් ගෙවන බවත් දන්වා ඇත.

9. එසේම ඉහත කී පළමුවන ප්‍රකාශයේ 4 වන ඡේදය මගින් තමාගේ ඉහත කී ලිපිකරු පළමුවන ශ්‍රේණියට උසස් කිරීමේ ලිපියේ සඳහන් වැටුප් පරිමාණය හා වැටුප් පියවර කිසිදු අවස්ථාවක සංශෝධනය කර නැති බවත්, එවැනි වැටුප් සංශෝධනය කිරීම් පිළිබඳ ලිපියක් නීත්‍යානුකූලව මෙතෙක් කිසිදු විටක තමන් වෙත තැපෑලෙන් හෝ කාර්යාලය මගින් ලබා දී නොමැති බවත් දක්වා ඇත.

10. 2000 වර්ෂයේදී තම වැටුප් වර්ධනය නොලැබුණ බවත් ඒ පිළිබඳව අභියාචනය ඉදිරිපත් කල පසු හිඟ වැටුප් සමග වැටුප් වර්ධකය ලැබුණු බවත්, ඊට අදාලව ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ MA/ADM/PF/978 හා 2006.06.26 දිනත් දරන ලිපිය ඇමුණු 2 වශයෙන් දක්වා ඉදිරිපත් කර ඇත.

11. අනතුරුව ඉල්ලුම්කාරිය ද දිගන මහවැලි අධිකාරියේ ලිපිකරු ඩී. එම්. ඒ. වීරසූරිය යන අයද පොල්ගොල්ල මහවැලි අධිකාරි කාර්යාලයේ ලිපිකාරිණී ඩී. එච්. එම්. සීතා පොඩි මැණිකේ යන අය (2011 වර්ෂයේ සිට විශ්‍රාම ගොස් ඇත.) යන තිදෙනාම 1997.11.27 වැනි දින සිට ලිපිකරු පළමුවන ශ්‍රේණියට උසස්වීම් ලැබූ බවත්, ඔවුන්ට එම පළමුවන ශ්‍රේණියට උසස් කිරීමට පෙර ද උසස් කිරීමේදී ද උසස් කිරීමෙන් පසුවද සමාන වැටුප් පරිමානයක් යටතේ සමාන වැටුප් පියවරවල් තබා 2009 ජූලි මාසයේ දක්වාම සමාන වැටුප් ලැබූ බවත් ඉල්ලුම්කාරිය හැර ඉහත කී දෙදෙනා මේ දක්වා ඔවුන්ගේ වැටුප් වල සංශෝධනයකින් තොරව වැටුප් ලබා ගන්නා බවත් දක්වා ඇත.

12. ඉහත කී පළමුවන ප්‍රකාශය මගින් තවදුරටත් කරුණු දක්වමින් අදාල සුවිශේෂී කාරණාවන් නොමැතිව තම වැටුප් පමණක් විශේෂ හේතු දැනුම් දීමකින් තොරව 2010 වර්ෂයේ සිට වැඩිපුර ගෙවා ඇතැයි පවසමින් ආපසු අයකරගත් බවත්, ඊට අදාලව ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ MA/ADM/08/05/28 හා 2009.07.07 දිනත් දරන ලිපිය ඇමුණු 3 වශයෙන් දක්වා ඉදිරිපත් කර ඇත.

13. ඉහත කී ඇමුණුම් අංක 3 දරන ලිපිය මගින් දැනුම් දී වැටුප් ආපසු අයකරගෙන ඇත්තේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ MA/ADM/PF/978 හා 2001.01.25 දිනත් දරන ලිපිය මගින් තමන්ට 2000.11.27 වැනි දිනට නියමිත වැටුප් වර්ධකය ලබාදී ඇති බව පසුව පරීක්ෂා කිරීමේදී පැහැදිලි වූ බවත් එබැවින් අධිකාරියේ අංක. MA/ADM/PF/978 සහ 2006.06.26 දිනැති ලිපිය අවලංගු කරන බවත් අධිකාරිය එකී MA/ADM/PF/08/0528 සහ 2009.07.07 දින දරන ලිපිය මගින් තම වැටුප් නිවැරදි කර ඇති බව දක්වා ඇතත් එකී ඇමුණුම් අංක 3 දරන ලිපියේ සඳහන් 2001.01.25 වැනි දින දරන වැටුප් සංශෝධනයක් හෝ ඒ සම්බන්ධ ලිපියක් මෙතෙක් තමන් වෙත ලැබී නොමැති බවත් එසේ හෙයින් කිසිදු සාධාරණ පදනමකින් තොරව අය කල මුදල් ආපසු තමන් වෙත ගෙවන ලෙසටත්, ඊට අදාල යම් අධිභාරයක යම් හිමිකමක් තිබේනම් එකී අධිභාරය ගෙවන ලෙසටත් මෙහිදී තම අර්ථ සාධක අරමුදලට යම් අඩුවීමක් සිදු වී ඇත්නම් එය ප්‍රතිපූර්ණය කරන ලෙසටත් ඉහත කී පළමු ප්‍රකාශය මගින් වැඩිදුරටත් ඉල්ලා ඇත.

14. ඉහත කී පළමු ප්‍රකාශයට ඉහත කී වගඋත්තරකාර මහවැලි අධිකාරිය විසින් තමා 2013.02.19 වැනි දින දරන ලිපිය මගින් කරුණු දක්වමින් ඉල්ලුම්කාරිය 1985.02.06 වැනි දින සිට වගඋත්තරකාර

අධිකාරියේ ලිපිකාර තනතුරකට පත්වීම ලබා අද දක්වා සේවයේ යෙදී සිටින බවත් එසේ පත්වීම් ලැබීමෙන් පසු 1990.03.01 වැනි දින ලිපිකරු II වැනි ශ්‍රේණියටත් 1997.11.27 වැනි දින I වැනි ශ්‍රේණියටත් උසස්වීම් ලබා ඇති බවත් පිළිගෙන ඇත.

15. ඉහත කී උත්තර ප්‍රකාශයේ 3 වන ඡේදය මගින් අධිකාරියේ වැටුප් විෂමතා වැටුප් වර්ධක හා වැටුප් සංශෝධනය පිළිබඳව මෙම ලිපිකරු ශ්‍රේණියේ මහත්ම මහත්මීන්ට ඉතා හොඳ අවබෝධයක් ඇති බවත් මෙම ඉල්ලුම්කාරිය 2010.11.27 දිනට නියමිත වැටුප් වර්ධකය තමුන්ට ලබා නොදුන් බව පවසා 2006.05.29 දාතමින් ලිපියක් ඉදිරිපත් කල බවත්, එකී ලිපිය වී 1 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇත. අනතුරුව ඇයගේ එකී ඉල්ලීම මත රු. 22,572.16 ක හිඟ වැටුප් ලෙස ගෙවා එතැන් සිට වැඩිපුර වැටුප් වර්ධකයක් ද අධිකාරිය විසින් ගෙවීමට කටයුතු කරන ලද බවත්, එකී ලිපිය වී. 2 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇත.

16. අනතුරුව නැවත පරීක්ෂා කිරීමේදී ඇය වෙත 2000.11.27 දිනට වැඩිපුර වැටුප් වර්ධකයක් ගෙවා ඇති බව තහවුරුවීම නිසා එය නිවැරදි කල බවත් එකී ලිපිය වී 3 ලෙස ලකුණු කරමින් දක්වා ඇත.

17. ඉහත කී වගඋත්තරකාර අධිකාරියේ 1997.11.27 වැනි දින වන විට ලිපිකරු පළමුවන ශ්‍රේණියේ සේවය කරමින් සිටියදී ලැබූ වැටුප රු. 5,429/- ක් බවත් වැටුප් ක්‍රමය රු. 5,365/ - 17 x 130 - රු. 7,575/- ක් බවත් ඊට අදාල චක්‍ර ලේඛණය වී 4 ලෙස ලකුණු කරමින් ඉදිරිපත් කර ඇත.

18. එකී දෙවන ප්‍රකාශයේ 7 වැනි ඡේදය මගින් මෙම ඉල්ලුම්කාරිය ලබමින් සිටි වැටුප් නව වැටුප් පරිමාණයේ පියවරයන් 2 ක් අතරට ගැනෙන හෙයින් ඊළඟ වැටුප් පියවර වන රු. 5,569/- යේ තබා උසස්වීම අනුව අතිරේක වැටුප් වර්ධකයක් ද ලබාදී රු. 5,711/- වැටුප් පියවරෙහි තබා 1998.01.01 දිනට වැටුප් සංශෝධනය අනුව ඉතිරි 60% ලැබෙන පරිදි රු. 7,025/- වැටුප් ගෙවීම් කල බව දක්වා ඇත.

19. ඉහත කී වගඋත්තරකාර අධිකාරියේ එකී ප්‍රකාශයේ 8 වන ඡේදය මගින් වැඩිදුරටත් කරුණු දක්වමින් මෙම ඉල්ලුම්කාරිය පහත දැක්වෙන පරිදි වැටුප් වර්ධක උපයාගෙන ඇති බව දක්වා ඇත.

| | |
|---|---|
| 1998.11.27 | රු. 7,230/- |
| 1999.11.27 | රු. 7,435/- |
| 2000.11.27 | රු. 7,640/- |
| 2001.11.27 | රු. 7,845/- |
| 2002.11.27 | රු. 8,050/- |

20. මේ අනුව කාර්යාලීය දෝෂයකින් එක් අවුරුද්දක එනම්, 2000.11.27 දිනට නියමිත වැටුප් වර්ධකය දෙවතාවක් ගෙවීම මත එම වරද නිවැරදි කර ගැනීමට අධිකාරිය කටයුතු කර ඇති බවත් ඉල්ලුම්කාරියට අගතියක් නොවන පරිදි ඉල්ලුම්කාරිය විශ්‍රාම ගැනීමේ වයස සළකා වැඩිපුර ගෙවා ඇති මුදල ආපසු අයකර ගැනීමට කටයුතු කර ඇති බවත්, එකී ලිපිය වී.3 ලෙස ලකුණු කර ඇති බවත්, මේ අනුව අධිකාරිය විසින් වැඩිපුර ගෙවා ඇති වැටුප් වර්ධකය නැවත අයකර ගැනීම පමණක් සිදුකර ඇති බැවින් මෙම අයදුම්පත ඉවතලන ලෙසත් ආයාචනය කර ඇත.

21. ඉහත කී වගඋත්තරකාර අධිකාරියේ පළමු ප්‍රකාශයට මෙම ඉල්ලුම්කාරිය පිළිතුරු සපයමින් දෙවන ප්‍රකාශය ගොනු කර ඇති අතර එහි පළමුවන ඡේදය මගින් දක්වා ඇත්තේ සමස්ථ මෙම වැටුප් වර්ධනය ආපසු අයකර ගැනීමට පදනම් කරගත්තාය කියන අධිකාරියේ MA/ADM/PF/978 හා 2001.01.25 දිනත් දරන ලිපිය නීත්‍යානුකූලව හා විධිමත්ව තමන්ට තැපැලින් හෝ ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් නොකළ බවත්, මෙම නඩුවේදී හෝ කිසිම අවස්ථාවක එකී ලිපිය හෝ එහි ඡායා පිටපතක් ඉදිරිපත් නොකල බවත්ය. 2013.02.19 දින වගඋත්තරකාර අධිකාරිය විසින් ඉදිරිපත් කල ලිපි ගොනුව මගින්ද එවැන්නක් ඉදිරිපත් නොකල බවත් ඒ වෙනුවට එල්. එච්. ලන්සක්කාර නමැති අයෙකුගේ වැටුප් සංශෝධන ලිපියක් ඉදිරිපත් කල බවත්ය. එසේම එකී දෙවන ප්‍රකාශය මගින් මෙම ඉල්ලුම්කාරිය සමග සේවය කරන අනිකුත් නිලධාරින් තමන්ට වඩා වැඩි වැටුපක් ලබන බවත් 2000 වර්ෂයේ වැටුප් වර්ධකය ආපසු අයකර ගැනීම බලවත් අසාධාරණයක් බවත් දන්වා ඇත.

22. HW/PR/466 හා 1998.02.24 වැනි දින දරන 1 ශ්‍රේණියට උසස් කිරීමේ ලිපියට අනුව 1997.11.27 දිනට රු. 5,853/- ක වැටුපත් 2000.11.27 දිනට නියමිත වැටුප් වර්ධකය නොලැබුණු බවත් 2002.11.27 දිනට වැටුප් වර්ධනය රු. 8,050/- ක් බවත් දක්වා ඇත.

23. එහෙත් පසුව කරන ලද ඉල්ලීම පරිදි MA/ADM/PF/978 හා 2006.06.26 දිනත් දරන ලිපිය මගින් නිවැරදි අදාල වර්ධකය හා හිඟ වැටුප් ලද බවත්, එම වැටුප් වර්ධකය 2009 ජූලි මස සිට ආපසු අය කිරීම තුලින් 2000.11.27 දිනට නියමිත වැටුප් වර්ධකය යලිත් අහිමි වී ඇති බව දක්වා ඇත. වගඋත්තරකාර අධිකාරියේ 2 වන ප්‍රකාශයේ 7 ඡේදයට අනුව රු. 5,711/- ක වැටුප් පියවරේ පිහිටුවා රු. 7,025/- ක වැටුපක් 1998.01.01 දිනට ගෙවූ බව දක්වා ඇතත් එසේ රු. 5,711/- ක වැටුප් පියවරේ පිහිට වූ බවට සඳහන් ලිපියක් තමන්ට ලබා දී නැති බවද දක්වා ඇත.

24. මේ අනුව අවසාන වශයෙන් එක් වැටුප් වර්ධනයක් අහිමි කිරීම හා ගෙවූ වැටුප් ආපසු අය කිරීම තුලින් අසාධාරණයක් සිදුවී ඇති බැවින් විධිමත්ව ලබාදී ඇති 1 ශ්‍රේණියට උසස් කිරීමේ ලිපිය අනුව 2000.11.27 දිනට නියමිත වැටුප් වර්ධකය හා හිඟ මුදල් ද, උක්ත වැටුප් වර්ධකය අහිමි කිරීම තුලින් අහිමි වූ සේ.අ.අ. දායක මුදලට අදාල මුදල් ප්‍රතිපූර්ණය කරන ලෙස ද ආයාචනය කර ඇත.

25. 2013.05.28 දාතමින් වගඋත්තරකාර අධිකාරිය විසින් ඉල්ලුම්කාරියගේ ඉහත කී දෙවන ප්‍රකාශයට පිළිතුරු සපයමින් පළමු පාර්ශ්වයේ වැටුප නිවැරදි කරන ලෙසට දන්වා ඇත්තේ ඇයගේ අංශභාර ප්‍රධානියා වෙත නිකුත් කරන ලද 2001.01.25 දින දරන ලිපිය වී.6 ලෙස ලකුණු කර එහි ඡායා පිටපතක් ඉදිරිපත් කර ඇත.

26. එසේම ඉල්ලුම්කාරිය වෙත වැඩිපුර ගෙවා ඇති වැටුප් සාධාරණ අන්දමින් අයකර ගැනීමට කටයුතු කර ඇති අතර එවැනි වැටුප් ආපසු අයකර ගැනීමට සියලු සේවකයින්ගෙන් කටයුතු කර ඇති බවත් දක්වා ඇත.

27. මෙම ආරවුල සම්බන්ධයෙන් බේරුම්කරණය විසින් විසඳිය යුතුව ඇත්තේ මෙම නඩුවේ ඉල්ලුම්කාරිය විසින් ඉල්ලා ඇති පරිදි සහ යොමුවේ දක්වා ඇති පරිදි ඉල්ලුම්කාරියගේ 2000.11.27 දිනට නියමිත වැටුප් වර්ධකය ගෙවා ඇති බව පවසමින් විශේෂ හේතු

දැක්වීමකින් තොරව මූලික වැටුප අඩුකර ගැනීම මගින් නැවත අයකර ගැනීම යුක්ති සහගත ද යන්න හා එසේ නොවන්නේ නම් ඇයට හිමි විය යුතු සහන මොනවාද යන්නය.

28. නඩු විභාගයේදී දෙපාර්ශවය විසින් ඉදිරිපත් කල ප්‍රකාශත් ඉල්ලුම්කාරිය සහ වගඋත්තරකාර පාර්ශ්වයේ සාක්ෂිකරුවන් ලබාදුන් වාචික සාක්ෂිත් ලකුණු කල ලේඛණත් සමස්ථයක් වශයෙන් සලකා බලමින් ඉහත දක්වා ඇති පරිදි ඉල්ලුම්කාරියගේ 2000.11.27 දිනට නියමිත වැටුප් වර්කය වැඩිපුර ගෙවා ඇති බව පවසමින් විශේෂ හේතු දැක්වීමකින් තොරව මූලික වැටුප අඩුකර ගැනීම මගින් නැවත අයකර ගැනීම යුක්ති සහගත නොවන බවට මම තීරණය කරමි.

29. මා එසේ තීරණය කිරීමට හේතු වූ කරුණ නම් ඉල්ලුම්කාරිය තම පළමු ප්‍රකාශයෙත් ද දක්වා ඇති පරිදි වගඋත්තරකාර පාර්ශ්වය විසින් ආර් 10 ලෙස ලකුණු කල ලේඛනය මගිනුත් ඉල්ලුම්කාරියට 2000.11.27 දිනට නියමිත වැටුප් වර්ධනය ගෙවා ඇති අතර ඉන් අනතුරුව එය කාර්යාලීය දෝෂයක් බව දක්වමින් ඉල්ලුම්කාරියගේ ඇමුණුම් අංක. 3 මගිනුත් වගඋත්තරකාර පාර්ශවය විසින් තම පළමුවන ප්‍රකාශයේ වී. 2 ලෙස ලකුණු කල ලේඛනය මගින් ද නිවැරදිව එකී 2000.11.27 වන දිනට නියමිත වැටුප් වර්ධකය ගෙවා ඇති නමුත් එහෙත් පසුව වගඋත්තරකාර පාර්ශ්වයේ 2009.07.07 දින හා වී. 3 ලෙස ලකුණු කල ලේඛන මගින් ඉල්ලුම්කාර පාර්ශ්වය තම පළමු ප්‍රකාශයේ, ඇමුණුම් අංක. 3 වශයෙන් ලකුණු කල ලේඛනය මගිනුත් ඉහත කී වැටුප් වර්ධකය නිවැරදි කරන බව දන්වා ඇත. එමගින් ඉල්ලුම්කාරියගේ ඇමුණුම අංක. 2 මගින් 2000.11.27 දිනට නියමිත වැටුප් වර්ධකය සමග වැටුප් පියවර රු. 7,845/- වී ඇතත් ඇමුණුම් අංක. 3 දරන සහ වී.6 දරන ලේඛනය මගින් ඇයගේ එකී අධිකාරිය පවසන අන්දමට 2000.11.27 දිනට නියමිත වැටුප් වර්ධකය සමග වැටුප් වර්ධකය රු. 7,640/- දක්වා අඩු වී ඇත. ඉහත කී ඇමුණුම් අංක. 2 සහ වී.6 ලේඛනයෙහි දක්වා ඇති වගඋත්තරකාර අධිකාරියේ MA/ADM/PF/978 හා 2006.06.26 දින දරන ලිපිය මගින් 2000.11.27 දිනට නියමිත වැටුප් වර්ධකය ලබාදී ඇති බවත් එසේ හෙයින් 2009.07.07 දිනත් ඇමුණුම් අංක. 3 හා වී 6 දරන ලිපියෙන් එකී ගෙවීම නිවැරදි කර ඇති බවත් දක්වා ඇත.

ඇමුණුම් අංක. 3 මගින් සහ වී. 6 දරන ලේඛනය මගින් ඉල්ලුම්කාරියට 2000.11.27 දිනට ගෙවන ලද බවට අදාල වැටුප් වර්ධකය ගෙවන ලද බව ඉල්ලුම්කාරියට දැන්වූ බවට වගඋත්තරකාර අධිකාරිය තර්ක කල ද එකී වී. 6 දරන ලේඛනය අමතා ඇත්තේ මූලික වැඩ පාලන ක්‍රියා කරවන්නේ නඩත්තු අංශයේ අධ්‍යක්ෂ යන අයට වන අතර එහි පිටපතක් හෝ ඉල්ලුම්කාරියට නිකුත් කර නොමැත.

30. එසේ වුවද මෙම නඩුවේ වගඋත්තරකාර පාර්ශ්වය විසින් ඔවුන් දක්වන වැඩිපුර ගෙවා ඇති වැටුප් වර්ධකය ආපසු අයකර ගත් බවට මෙම නිලධාරිනිය මෙන්ම වෙනත් සේවකයින්ගෙන් සිදු කල බවට දක්වන ස්ථාවරය තහවුරු කිරීමට එච්. ඒ. ලංසක්කාර යන නිලධාරියෙකු වෙත නිකුත් කරන ලද ලිපියක් ආර් 7 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇත. එම ලිපිය පැහැදිලිවම එකී නිලධාරියාගේ නමට නිකුත් කර ඇති අතර එහි අදාල පරිදි වැටුප් සංශෝධනය කරන බවත් වැඩිපුර ගෙවා ඇති මුදල් ආපසු අයකර ගන්නා බවත් දක්වා ඇතත් එවැනි ලිපියක් ඉල්ලුම්කාරිය වෙත නිකුත් කල බවට කිසිදු ලිපියක් නඩු විභාගයේදී ලකුණු කල ලේඛන සමග හෝ වාචික සාක්ෂිවලදී ඉදිරිපත් කර නොමැත.

31. ඊට අතිරේකව ඉල්ලුම්කාරියගේ එකී වැටුප් සංශෝධනය සම්බන්ධයෙන් කිසිදු ලිපියක් තමනට නොලැබුන බව තම පළමු හා දෙවන ප්‍රකාශ මගින්ද වාචික සාක්ෂි මගින්ද සත්‍යතා වැඩිබර රීතියට අනුකූලව බේරුම්කරණය සෑහීමකට පත්වන පරිදි එකී කරුණු ඉල්ලුම්කාරිය විසින් සනාථ කර ඇත. ඉල්ලුම්කාරිය වගඋත්තරකාර පාර්ශ්වයේ හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් මෙසේ ප්‍රකාශ කර ඇත.

*වැඩිදුර හරස් ප්‍රශ්න :*

ප්‍රශ්නය : ඉල්ලුම්කාරිය තමන් පෙර දින ගරු අධිකරණයට කියා සිටියා නේද තමන්ට 2000 වර්ෂයට අදාල වැටුප් වර්ෂයට හිමි වුනේ නැහැ කියලා.

උත්තරය : ඔව්

ප්‍රශ්නය : 2000 වර්ෂයට හිමි වැටුප් වර්ධකය හිමි වන්නේ කුමන අවුරුද්දේ ද ?

උත්තරය : 2001 තමයි සාමාන්‍යයෙන් ලැබෙන්නේ

ප්‍රශ්නය : තමන්ට 2000 වැටුප් වර්ධකය ලැබුනේ නැති වුනාම ඒ පිළිබඳව අදාල නිලධාරියාගෙන් විමසීමක් කලාද?

උත්තරය : ඔව්. දිගන කාර්යාලයට දන්වා සිටියා.

ප්‍රශ්නය : එම නිලධාරියා තමන්ට මොනවාද කිව්වේ.

උත්තරය : මොනවත් කිව්වේ නැහැ. කිසිදු උත්තරයක් දුන්නේ නෑ.

ප්‍රශ්නය : ඉල්ලුම්කාරිය මෙම යෝජනා කරනවා 2000 වර්ෂයේ තමන්ට දිගන කාර්යාලයේ අදාල නිලධාරියාගෙන් ඒ පිළිබඳව විමසීමක් සිදු කල අවස්ථාවේදී සම්පූර්ණ විස්තරයක් තමන්ට ඒ නිලධාරියා ලබා දුන් බවට.

උත්තරය : මම ඒ යෝජනාව ප්‍රතික්ෂේප කරනවා. මට පැහැදිලි කිරීමක් කලේ නැහැ.

ප්‍රශ්නය : ඉල්ලුම්කාරිය තමන්ට හිමි 2000 වර්ෂයට හිමි වැටුප් වර්ධකය හිමි වුනේ නැහැ කියලා ඉල්ලීමක් කලේ කුමන අවුරුද්දේ ද ?

උත්තරය : 2006 වර්ෂයේ

ප්‍රශ්නය : තමන් කොහේටද එම ඉල්ලීම කලේ

උත්තරය : කොළඹ ප්‍රධාන කාර්යාලයට

ප්‍රශ්නය : ඒ කියන්නේ ඔබගේ ආසන්නම ප්‍රධානියා ප්‍රධාන කාර්යාලයේ ද සිටියේ

උත්තරය : දිගන කාර්යාලයේ පැහැදිලි කිරීමක් නොකල නිසා ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කලා.

ප්‍රශ්නය : ඉල්ලුම්කාරිය මම නැවත ඔබට යෝජනා කරනවා ඔබට 2000 වර්ෂයට හිමි වැටුප් වර්ධනය හිමි වුනේ නෑ කියලා. ඔබ ආසන්නතම ප්‍රධානියාට ලිඛිතව කිසිදු ඉල්ලීමක් නොකලේ ඒ අවස්ථාව වන විට ආසන්නම නිලධාරියා ඔබට ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කර තිබෙන නිසා කියලා.

උත්තරය : එසේ පැහැදිලි කිරීමක් කලේ නැහැ. (සාක්ෂි සටහන් 2013.09.02 පිටුව 2, 4)

මේ අනුව යම් සේවකයෙකුගේ වැටුප් සම්බන්ධයෙන් තීරණයක් ඔහුට පෞද්ගලිකව ලිඛිතව දැනුම් දිය යුතු නමුත් ඒ අනුව කටයුතු කිරීමට වගඋත්තර අධිකාරිය අපොහොසත් වී ඇති බවට මම තීරණය කරමි.

32. මින් අනතුරුව මා විසින් සලකා බැලිය යුත්තේ එකී තීරණය අනුව කිනම් සහන මේ ඉල්ලුම්කාරියට හිමි විය යුතුද යන්න වේ.

33. මෙම නඩුව සඳහා වගඋත්තරකාර අධිකාරිය විසින් ගොනුකර ඇති පළමු ප්‍රකාශයේ ඉහත කී වැටුප් වර්ධකය ගෙවීමේදී හිඟ වැටුප් වශයෙන් ඉල්ලුම්කාරියට රු. 22,572.16 ක මුදලක් ගෙවා ඇති බවත්,

34. එකී මුදල ආපසු අයකර ගැනීම මෙම නඩුවට හේතු වී ඇති බැවින් එසේ ආපසු අයකර ගත් මුදල වන රු. 22,572.16 ක මුදල ඉල්ලුම්කාරියට මෙම නඩුවේ වගඋත්තරකාර ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ආපසු ගෙවිය යුතු බවට මෙයින් නියෝග කරමි.

35. තවද එකී රු. 22,572.16 ක මුදල මෙහි ඉල්ලුම්කාරියට ලබාගත හැකි වන පරිදි 2014.09.18 වන දින හෝ ඊට පෙර සහකාර කම්කරු කොමසාරිස් (මැද කොළඹ) වෙත තැන්පත් කල යුතු බවට ද, වගඋත්තරකාර ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට මෙයින් වැඩිදුරටත් නියෝග කරමි.

36. ඊට අතිරේකව ඉල්ලුම්කාරිය මෙන්ම වගඋත්තරකාර අධිකාරියද නඩු විභාගයේදී ඉදිරිපත් කල වගඋත්තරකාර අධිකාරියේ අංක MA/ADM/PF/978 හා 2006.06.26 දිනැති ලිපියේ දැක්වෙන පරිදි 2000.11.27 දිනට නියමිත අදාල වැටුප් වර්ධකය ඉල්ලුම්කාරියට ලබාදිය යුතු ලෙසටද, අනතුරුව නියමිත පරිදි වැටුප් වර්ධකයන් ලබාදිය යුතු ලෙසටද, ඒ අනුව හිඟ මුදලක් වේ නම් එකී හිඟ මුදල් ඉල්ලුම්කාරියට ගෙවිය යුතු බවට ද, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට වැඩිදුරටත් මෙයින් නියෝග කරමි.

37. තවද මෙම ආපසු අයකිරීම් නිසා ඉල්ලුම්කාරියගේ සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් අඩුවෙන් ගෙවා ඇත්නම් එසේ අඩුවෙන් ගෙවන ලද මුදලද එකී සේවක අර්ථ සාධක අරමුදල වෙත බැර කල යුතු බවටද වගඋත්තරකාර ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට මෙයින් වැඩිදුරටත් නියෝග කරමි.

38. මෙය සාධාරණ හා යුක්ති සහගත තීන්දුවක් හා ප්‍රදානයක් කොට මම සලකමි.

පී. දනන්සූරිය,
බේරුම්කරු.

වර්ෂ 2014 ක් වූ අගෝස්තු මස 18 වන දින,
කොළඹ දී ය.

09 - 1168

---

මගේ අංකය : IR/10/22/2010

## කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2012.09.14 වැනි දිනැති හා අංක 1775/21 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2012.09.06 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් අළුබෝමුල්ල, අරුග්ගොඩ, සිරි පැරකුම් මාවත, නො. 433/බී හි පදිංචි ලීලා හෙට්ටිආරච්චි මිය හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 10, කිරුල පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2014.08.19 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඩබ්. ජේ. එල් යූ. විජයවීර,
*වැ.බ.* - කම්කරු කොමසාරිස්.

2014 සැප්තැම්බර් මස 05 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කොළඹ අධිකරණයේ දී ය.

ලීලා හෙට්ටිආරච්චි මිය,
නො. 433/බී. සිරි පැරකුම් මාවත,
අරුග්ගොඩ,
අළුබෝමුල්ල.

නඩු අංකය : ඒ/3475 *පළමු පාර්ශවය*

සහ

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය,
ප්‍රධාන කාර්යාලය,
අංක 200, කිරුළ පාර,
කොළඹ 05.

*දෙවන පාර්ශවය.*

*අතර පවත්නා කාර්මික ආරාවුල සම්බන්ධවයි*

ප්‍රදානය

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගරු ගාමිණී ලොකුගේ මහතා විසින් 1957 අංක 14 සහ 1957 අංක 62, 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන)

පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තියෙන් ගරු කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල අනුව, උක්ත ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරුවෙකු වශයෙන් 2012.09.06 වැනි දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ :

2004 මාර්තු මස සිට 2005 මැයි මස දක්වා කාලය සඳහා ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ VI ශ්‍රේණියේ ලිපිකාරිණියක ලෙස අනියම් සේවයේ පිහිටුවා ඇති ලීලා හෙට්ටිආරච්චි මහත්මියට කොන්ත්‍රාත් පදනම යටතේ වැටුප් ගෙවීම් යුක්ති සහගත ද, යන්න හා එසේ නොවන්නේ නම් ඇයට හිමිවිය යුතු හිඟ වැටුප හා වෙනත් සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.

*පෙනී සිටීම :*

මෙම නඩුවේ 01 වන පාර්ශවකරු වන ලීලා හෙට්ටිආරච්චි මහත්මිය සමග නියෝජිත වශයෙන් බමුණුගම ලියන ආරච්චිලාගේ බුද්ධි නිමල් ජයසේකර මහතා නියෝජනය කරන ලදී.

02 වන පාර්ශවකරු වෙනුවෙන් රජයේ නීතිඥ දිස්නා ප්‍රනාන්දු මහත්මිය පෙනී සිටින ලදී.

ආයතනය වෙනුවෙන් සහකාර නීති නිලධාරිනී නිමාෂා අයන්ති මහත්මිය සමග ගිණුම් ලිපිකාරිනි අබිලා මනෝජ් ද සිල්වා මහත්මිය සමග අධිකරණ සහකය තෙවරාතන්ත්‍රිලාගේ නෙල්සන් ආතර් ප්‍රනාන්දු මහතා පෙනී සිටින ලදී.

පාර්ශ්වයන් විසින් විධිමත් ලෙස ප්‍රකාශ ගොනු කිරීමෙන් අනතුරුව 02 වන පාර්ශ්වය විසින් 2012.12.12 වන දින නඩුව ආරම්භ කර තේවරාතන්ත්‍රිලාගේ නෙල්සන් ආතර් ප්‍රනාන්දු යන අයගේ සාක්ෂි මෙහෙයවා 2013.02.22 වන දින අවසන් කර 2013.06.07 වන දින හිතනාදුර අබිලා මනෝජ් ද සිල්වා මහත්මියගේ සාක්ෂි ආරම්භ කර ඇයගේ සාක්ෂි අවසන් කිරීමට පෙර 2014.02.05 වන දින 02 වන පාර්ශවකරු වශයෙන් නඩුව සමථයකට පත් කරන්නට යෝජනාව ඉදිරිපත් කරන ලදී. එකී යෝජනාව අනුව පාර්ශවකරුවන් දෙදෙනාටම නඩුව අවසන් කිරීමට ඉඩ ප්‍රස්ථාව තිබුණ නිසා එම ඉල්ලීමට ඉඩ දෙමින් සමථ යෝජනාව ඉදිරිපත් කරන්නට පාර්ශ්වකරුවන් දෙදෙනාටම මා විසින් නියෝග කරන ලදී.

ඒ අනුව 2014.08.04 වන දින පහත කරුණුවලට යටත්ව පාර්ශ්වකරුවන් දෙදෙනාම සමථයට එළඹෙන ලදී.

කෙසේ වෙතත් එදින එම චෙක්පතෙහි සඳහන් කරන ලද මුදල පරීක්ෂා කරන ලද අවස්ථාවේ දී ඉලක්කමින් නිවැරදිව සඳහන් කර තිබුනත් අකුරෙන් සඳහන් කරන ලද කොටසෙහි පනස් නමදාස් හත්සිය හැත්තෑ දෙකයි ශත දහතුනක් ලෙස සඳහන්ව ඇත. එම නිසා, එය නිවැරදිකර 2014.08.08 වන දින ගෙවීම සඳහා කැඳවන ලදී, ඒ අනුව සමථ නියෝගය මෙසේ ය.

2014.08.08 වන දින දෙවන පාර්ශ්වය විසින් විවෘත අධිකරණයේදී ගෙවීම සඳහා රැගෙන එන ලද චෙක්පත එනම්, මහජන බැංකුවේ අංක 633765 දරන 2014.07.31 දිනැති ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ කළුතර ප්‍රාදේශීකය විසින් නිකුත් කර ඇති මෙම චෙක්පතෙහි චෙක්පත් ලාභියා වශයෙන් ලීලා හෙට්ටිආරච්චි වශයෙන් 01 වන පාර්ශවකාරියගේ නම සඳහන් වන අතර එම චෙක්පත බැර විය යුත්තේ ඇය විසින් 02 වන පාර්ශවයට ලබාදී ඇති ඉතිරි කිරීමේ බැංකුවේ ගිණුම් අංක 1-0043-88-2491-6 ට ය. මෙම චෙක්පතෙහි 01 වන පාර්ශවකාරියට ගෙවනු ලබන මුදල වශයෙන් ඉලක්කමෙන් රුපියල් 59772.73 ක මුදලක් සඳහන් වන අතර අකුරෙන් රුපියල් පනස් නමදාහස් හත්සිය හැත්තෑ දෙකයි ශත හැත්තෑ තුනක් පමණි - වශයෙන් සඳහන් කර එම ස්ථානයේ 2014.08.04 වන දින ඉදිරිපත් කරන ලද චෙක් පතෙහි වැරදීමකින් සඳහන් වූ රුපියල් පනස් නමදාහස් හත්සිය හැත්තෑ දෙකයි ශත දහතුනක් පමණි - යන්නයි දහතුනක් පමණි, යන්න කපා හැර, එම කපා හැරීම නිවැරදි කරමින් නැවතත් එය සංශෝධනය කරමින් අකුරෙන් රුපියල් පනස් නමදාහස් හත්සිය හැත්තෑ දෙකයි ශත හැත්තෑ තුනක් පමණි - වශයෙන් ලියා එම සංශෝධනය තහවුරු කරමින්, ඒ සඳහා අනුමැතිය මෙම චෙක්පතෙහි පළමු බලයලත් නිලධාරි හා දෙවන බලයලත් නිලධාරි වශයෙන් මෙම චෙක්පතට අත්සන් තබා ඇති බලයලත් නිලධාරින් දෙදෙනා නැවතත් අත්සන් තබා ඇත.

මෙම චෙක් පතෙහි ආදායකයාගේ ගිණුමට පමණයි, දින 60 කට පමණක් වලංගුයි වශයෙන් සඳහන් වන රබර් මුද්‍රාවක් මගින් එම චෙක් පතෙහි දිනය වන 2014.07.31 වන දින සිට දින 60 කට පමණක් වලංගු වන බවත්, මෙම චෙක් පතෙහි සඳහන් රුපියල් පනස් නමදාහස් හත්සිය හැත්තෑ දෙකයි ශත හැත්තෑ තුනක මුදල ආදායකයා වන මෙම නඩුවේ 01 වන පාර්ශවකාරිය වන ලීලා හෙට්ටිආරච්චි මහත්මියගේ ගිණුමට වලංගු වන බව දක්වා ඇත. ඒ අනුව අද දින අංක 633765 දරන චෙක්පත 02 වන පාර්ශවය විසින් පූර්ණ හා අවසාන සමථයක් වශයෙන් 01 වන පාර්ශවකාරියට විවෘත අධිකරණයේ දී භාර දෙනු ලබන අතර එම චෙක්පත භාරගත් බවට ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ ගෙවීම් වවුචරයේ අත්සන තැබීම ද, සිදු කරන ලදී. ඒ අනුව ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ ගෙවීම් වවුචරයේ සේවා ස්ථානය ප්‍රාදේශීය කාර්යාලය ලෙසත්, කොට්ඨාශය මුදල් කොට්ඨාශය ලෙසත්, වවුචර් අංක 698 ලෙසත්, වවුචරයේ දිනය 2014.07.31 ලෙසත් දක්වා ඇත. මෙම නඩුවේ ලීලා හෙට්ටිආරච්චි (අනියම් වෙස්කෝ සේවක) ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ගිණුම් අංක 1-0043-88-2491-6 ට බැර වශයෙන් දක්වා ඇත.

එම කරුණු සනාථ කිරීම සඳහා මෙම රුපියල් 59,772.73 ක මුදල 01 වන පාර්ශවකාරියට ගෙවීම සඳහා වැය සහතික කරන නිලධාරි වශයෙන් ප්‍රාදේශීය මුදල් කළමණාකාර කොළඹ ප්‍රාදේශීය පාලන කාර්යාලය ශ්‍රී ලංකා මධ්‍යම ඩිපෝ සංකීර්ණය පිටකොටුව වශයෙන් රබර් මුද්‍රා තබන ලද නිලධාරි තැන විසින් 2014.07.31 වන දින අත්සන් තබා ඇත. එම වැය සහතික කරන නිලධාරි, මාගේ පෞද්ගලික දැනුම මීට අදාල වන යොමුවල ඇති සහතිකය/මෙහි පිට පැත්තේ ඇති විස්තරය අනුව ඉහත සඳහන් සැපයීම් සේවා/වැඩ නියම අවසරය ඇතිව කල බව ඒ සඳහා රුපියල් 59,772.73 ක් ගෙවීම් රෙගුලාසිවල/කොන්ත්‍රාත්තුවේ ප්‍රකාර සාධාරණ හා යුක්ති සහගත වන බවත් සහතික කරමි. මුද්‍රිත සඳහනකට වැය සහතික කරන නිලධාරියා වන ප්‍රාදේශීය කළමණාකාර තැන අත්සන් තබා ඇත.

ඒ ආකාරයෙන් විධිමත් නීති රෙගුලාසිවලට යටත්ව ඉහත සඳහන් මුදල දෙවන පාර්ශවය විසින් 01 වන පාර්ශවකාරියට විවෘත අධිකරණයේ දී ගෙවන ලද අතර එය තහවුරු කිරීම සඳහා 01 වන පාර්ශවකාරිය වන ලීලා හෙට්ටිආරච්චි සමග ඇයගේ නියෝජිත වන බමුණුගම ලියන ආරච්චිලාගේ බුද්ධි නිමල් ජයසේකර ඉහත සඳහන් මුදල භාරගත් බවට සනාථ කරමින් නඩු වාර්තාවේ අත්සන් කරන ලදී. තවද, සාක්ෂිකරු වශයෙන් දෙවන පාර්ශ්වයේ තෙවරාතන්ත්‍රිලාගේ නෙල්සන් ආතර් ප්‍රනාන්දු යන අය නඩු වාර්තාවේ අත්සන් කරන ලදී. එසේ ම ඊට අදාල ලියවිලි ද නඩු වාර්තාවට ගොනු කර ඇත.

මෙම සමථය පාර්ශවකරුවන් දෙදෙනාම එකඟ වූ පරිදි එළඹුණු සම්පූර්ණ සහ අවසාන සමථයක් වේ. ඒ අනුව මෙම සමථ නියෝගය ප්‍රකාශනය කරමින් අවසන් කරමි.

මෙම ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව මාගේ නිගමනය වේ.

(ටී, එඩ්මන්ඩ් සාන්තරාජන්)
බේරුම්කරු.

2014 අගෝස්තු මස 19 වන දින,
කොළඹ කාර්මික අධිකරයේ දී ය.

09 - 1169

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.